**ද්විතීය නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතියේ (ණය අංක 1993 -ශ්‍රී) 2014**

---

ද්විතීය නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සහ ආසියානු සංවර්ධන බැංකුව සමඟ එළඹි 2003 අගෝස්තු 18 දිනැති ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 කොටස සහ 2003 අගෝස්තු 18 දිනැති ණය ගිවිසුමේ උප ලේඛන 6 හී 28 වන කොටස සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය එවකට ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. උතුරු මැද පළාතේ අනුරාධපුර සහ පොළොන්නරු දිස්ත්‍රික්කවල ග්‍රාමීය ප්‍රදේශ මෙන්ම මඩකළපුව, හම්බන්තොට, මූතූර් හා පොළොන්නරුව නගරවල ජීවත් වන ආසන්න වශයෙන් 969,000 ක් වන ජනතාවට සුරක්ෂිත ජලය හා පවුල් 32,572 ක ජනතාව සඳහා සනීපාරක්ෂක පහසුකම් සැපයීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වේ. එය ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ මූල්‍ය හා ආයතනික පැවැත්ම මෙන්ම පළාත් සභා, ප්රාදේශීය සභා හා ප්‍රජා මූල සංවිධානවල ආයතනික ධාරිතාව වැඩිකරයි. 2003 අගෝස්තු 18 දිනැති අංක 1993 ශ්‍රී- (එස්එෆ්) ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ මූලික ඇස්තමේන්තු මුළු පිරිවැය රු. මිලියන 8,310.22 කට සමාන එ.ජ.ඩො. මිලියන 86.34 ක් වූ අතර එයින් රු. මිලියන 5,802.91 කට සමාන එ.ජ.ඩො. මිලියන 60.29 ක් හෝ සියයට 70 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී ඇති අතර රු.මිලියන 291.63 කට සමාන එ.ජ.ඩො. මිලියන 3.03 ක් හෝ සියයට 4 ක් ප්‍රජා මූල සංවිධාන විසින් දායකත්වය සැපයීමට අපේක්ෂිත විය. පසුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු. මිලියන 14,297 කට සමාන එ.ජ.ඩො. මිලියන 131.03 ක් දක්වා වැඩිවූ අතර ඉන් රු. මිලියන 7,911 කට සමාන එ.ජ.ඩො. මිලියන 72.51 ක් හෝ සියයට 55 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී ඇත. තවද, විශේෂ අරමුදල් ණය අංක 2276 -ශ්‍රී හා ආසියානු සංවර්ධන බැංකුවේ පොදු ප්‍රාග්ධන සම්පත් ණය අංක 2275 - ශ්‍රී යටතේ රු. මිලියන 6,720 කට සමාන එ.ජ.ඩො. මිලියන 61.59 ක අතුරු ණයක් ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදනය කර තිබුණි. කෙසේ වෙතත් සංශෝධිත පිරිවැය ඇස්තමේන්තුව අනුව ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම සඳහා පිරිවැය ඉක්මවා යෑම හේතුවෙන්, ණය අංක 2757- ශ්‍රී හා ණය අංක 2758 යටතේ රු. මිලියන 1,637 කට සමාන එ.ජ.ඩො. මිලියන 15 ක තවත් අමතර ණය දෙකක් ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දී තිබුණි. ව්‍යාපෘතිය එහි ක්‍රියාකාරකම් 2003 නොවැම්බර් 21 දින ආරම්භ කළ අතර 2009 මාර්තු 31 දින වන විට අවසන් කිරීමට නියමිත විය. පසුව ව්‍යාපෘති කාලය 2011 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි. ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2013 පෙබරවාරි දක්වා මුළු ණය මුදල උපයෝජනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත් ශ්‍රී ලංකා රජයෙන් ලද දායකත්වයෙන්, ව්‍යාපෘතියේ ඉතිරි වැඩ 2014 දෙසැම්බර් 31 දක්වා පවත්වාගෙන ගොස් තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරික්ෂා කිරීම්ද පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජයේ අරමුදලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඉ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

## 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව සහ

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

### 2.2.1 ලැබිය යුතු ගිණුම්

-----------------

පිරිපහදු යන්ත්‍ර පරික්ෂා කිරීම සඳහා කොන්ත්‍රාත්කරු වෙනුවෙන් 2010 දී ව්‍යාපෘතිය විසින් ගෙවන ලද රු. මිලියන 4.7 ක විදුලි ගාස්තු වටිනාකමින් 2014 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගත යුතු රු. මිලියන 2.7 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

### 2.2.2 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්

---

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.12 වගන්තිය, 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනතේ 21 වන වගන්තිය හා 2002 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 364 (3) අංක 5 ඡේදය අනුව, සමාලෝචිත වර්ෂය තුළදී සිදු කළ එකතුව රු. මිලියන 41 ක එකතු කළ අගය මත බදු ගෙවීම් පිළිබඳ මාසික වාර්තාවක් විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 1987 අංක 03 දරන පොදු ගිවිසුම් පනතේ 08 වන වගන්තිය ප්‍රකාරව වටිනාකම රු. මිලියන 5 හෝ ඊට වැඩි කොන්ත්‍රාත් බාර ගනු ලබන කොන්ත්‍රාත්කරුවන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි විය යුතුය. එසේම ටෙන්ඩර පිරිනැමීමෙන් පසු දින 60 ක් ඇතුළත ටෙන්ඩර් ගිවිසුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ යුතුය. කෙසේ වෙතත් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල නියුතු කොන්ත්‍රාත්කරුවන් 09 දෙනෙක් මෙම අවශ්‍යතාවය සම්පූර්ණ කර නොතිබුණි.

### 2.2.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

---

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) ප්‍රමාණ වැඩ, පිරිපහදු නොකළ ජලය සම්ප්‍රේෂණය, පිරිපහදු කිරීමේ පිරියත සහ පිරිපහදු කළ ජලය බෙදාහැරීම් හා පවත්නා ජල පිරිපහදු කිරීමේ පිරියත ප්‍රතිසංස්කරණය කර ඉදිකිරීම හා සම්පූර්ණ කිරීම සඳහා අදාළ වූ කොන්ත්‍රාත්තුව යටතේ කොන්ත්‍රාත්කරු විසින් සපයන ලද එ.ජ.ඩො. 80,946 ක් හා රු. 802,610 ක අගය වූ නිර්දේශිත අනිවාර්ය අමතර කොටස් සඳහා භාණ්ඩ ලැබීම් පත්‍ර, සැපයුම්කරුගේ ඉන්වොයිසි ආදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ වාර්තා අනුව, බෙදා හැරීමේ නල සැපයීම හා එලීමේ හා උපජල කුලුණු ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව යටතේ කලුගල් ඝන මීටර 3,143 ක් කැණීම් කර තිබුණු අතර ඒ සඳහා රු.මිලියන 11 ක් වියදම් කර තිබුණි. කෙසේ වෙතත් කැණීම්කර ලබාගත් කලුගල් භාවිතා කළ බව හෝ විකුණූ බව තහවුරු කර ගැනීමට හැකි කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවුනි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

---

### 3.1 අරමුදල් උපයෝජනය

---

අරමුදල් මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම් අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ වටිනාකම | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ ප්‍රතිපාදනය | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) |
| ආ.සං.බැ. | 72.51 | 7,911.00 | - | - | - | 71.33 | 7,742.77 |
| ශ්‍රී.ලං.ර | 58.52 | 6,385.00 | 200.00 | 1.50 | 199.04 | 57.34 | 6,776.05 |
| එකතුව | **131.03** | **14,296.00** | **200.00** | **1.50** | **199.04** | **128.67** | **14,518.82** |

**3.2 භෞතික ප්‍රගතිය**

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) නියමිත කාලපරිච්ඡේදය තුළ ප්‍රතිපාදිත සම්පත් භාවිතයෙන් ව්‍යාපෘති අරමුණු සපුරාගැනීම තහවුරු කරගැනීමට මාසික, කාර්තුමය, අර්ධ වාර්ෂික ලෙස සමස්ථ ව්‍යාපෘති කාලය ආවරණය වන පරිදි වගකීම් සහිතව භෞතික හා මූල්‍ය ඉලක්ක උද්දීපනය වන පරිදි පුළුල් විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතුය. ව්‍යාපෘතිය විසින් එවැනි සැලැසුම් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) උතුරු මැද පළාත හා මඩකළපුව, හම්බන්තොට, මුතූර් හා පොළොන්නරුව නගරවල ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන 969,000 ක් පමණ ජනතාවට සුරක්ෂිත ජලය සැපයීමට ව්‍යාපෘතිය අපේක්ෂා කර තිබුණද ලබා දුන් ජල සම්බන්ධතාවලට අදාල සංඛ්‍යා දත්ත ව්‍යාපෘතිය විසින් විගණනය සඳහා ඉදිරිපත් නොකරන ලදි.

(ඇ) ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩසටහන යටතේ උතුරු මැද පළාත හා මඩකළපුව, හම්බන්තොට, මූතූර් හා පොළොන්නරුව නගරවල පවුල් 32,572 කට සනීපාරක්ෂණ පහසුකම් සැපයීමට රු. මිලියන 135 ක් ව්‍යාපෘතිය ප්‍රතිපාදනය කර තිබුණි. කෙසේ වෙතත් තත්‍ය කාර්ය සාධනය සමඟ සමාන වන පරිදි වරින් වර මූලික ඉලක්ක සැලකිය යුතු ලෙස සංශෝධනය කර තිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 126 ක් වැය කරමින් පවුල් 22,511 ක් සඳහා පමණක් සනීපාරක්ෂණ පහසුකම් ලබා දී තිබුණු බව නිරීක්ෂණය විය.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

ඉදිරිපත් කළ තොරතුරු අනුව, කොන්ත්‍රාත් 09 ක් යටතේ හම්බන්තොට, මඩකළපුව, මූතූර් හා පොළොන්නරුවෙන් සිදු කළ ව්‍යාපෘතියේ සියළු ඉදිකිරීම් වැඩ 2012 ජනවාරි 31 දිනට සම්පූර්ණ කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) බෙදාහැරිමේ නල සැපයීම හා එලීම මෙන්ම ජල කුළුණු ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුගේ අතුරු ගෙවීම් පියවීමේදී වූ ප්‍රමාදයන් මත එ.ජ.ඩො. 38,023 ක් හා රු. 229,167 ක් වටිනා මූල්‍ය ගාස්තු සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි.

(ආ) ජල සම්පාදන යෝජනා ක්‍රම ඉදිකිරීම සඳහා මඩකළපුව, හම්බන්තොට, පොළොන්නරුව හා මූතූර්වල ඉඩම් කට්ටි 26 ක් සඳහා හිමිකම 2014 දෙසැම්බර් 31 වන විටත් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත මාරු කර නොතිබුණි.

(ඇ) කෙසේ වෙතත් මඩකළපුව හා මූතූර්වල සිදු කළ කොන්ත්‍රාත් වැඩ 03 ක් රු. මිලියන 1,888 ක් වැය කරමින් බොහෝ දුරට සම්පූර්ණ කර තිබුණු අතර බොහෝ දුරට සම්පූර්ණ කිරීමේ සහතික සමඟ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට 2011 සැප්තැම්බර් 30 දිනට බාර දී තිබුණද, 2014 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් සම්පූර්ණ කිරීමේ සහතික නිකුත් කර නොතිබුණි.

### 3.4 මතභේදයට තුඩු දෙන කරුණු

--------------------------------

කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකුට 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු. මිලියන 229.5 ක් රජයෙන් ලැබිය යුතු දායකත්වයෙන් පියවීමට නියමිත අතර භාණ්ඩාගාරය විසින් එය තහවුරු කර නොතිබියදීත් ඒ වෙනුවෙන් ගිණුම්වලට ගැලපීම් සිදු කර තිබුණි.

### 3.5 මූල්‍ය පාලනය සම්බන්ධ ගැටළු

---------------------------------

2010 ජූලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ අවශ්‍යතාවයන් අනුව, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ ගණුදෙනු ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට භාජනය කර නොතිබුණි.